// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2245/31 - 2021 සැප්තැම්බර් මස 17 වැනි සිකුරාදා - 2021.09.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 24/51 (VII)

**(203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනත**

(203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 213ආ වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 237 වන වගන්තිය යටතේ ප්‍රවාහන අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

ප්‍රවාහන අමාත්‍ය.

2021 සැප්තැම්බර් මස 10 වැනි දින,
කොළඹ දී ය.

**නියෝග**

1. මේ නියෝග 2021 අංක 1 දරන මෝටර් වාහන (මාර්ග ආරක්ෂා අරමුදල) නියෝග වශයෙන් හඳුන්වනු ලබන අතර, එය 2021 ඔක්තෝබර් මස 01 වැනි දින සිට බලාත්මක විය යුතු ය.

2. (203 අධිකාරය වූ) මෝටර් වාහන පනතේ VI වන කොටස යටතේ තෘතීය පාර්ශවයේ අවදානම් සම්බන්ධයෙන්, අවස්ථාවෝචිත පරිදි, රක්ෂණ ඔප්පුවක් හෝ ඇපයක් නිකුත් කරනු ලබන සෑම රක්ෂකයකු හෝ තැනැත්තකු වාරික මුදලින් සියයට දෙකකින් (2%) අරමුදලට දායක විය යුතු ය.

3. 2004 නොවැම්බර් මස 24 දිනැති අංක 1368/18 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරනු ලැබූ 2004 අංක 01 දරන මාර්ග ආරක්ෂා අරමුදල නියෝග, ඒ යටතේ මින් පෙර සිදු කරන ලද කිසිවකට අගති රහිතව මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

4. මේ නියෝගවල කාර්යය සඳහා -

"අරමුදල" යන්නෙන්, (203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 213ආ(2) වගන්තිය යටතේ පිහිටවනු ලැබූ මාර්ග ආරක්ෂා අරමුදල අදහස් වේ.

1A - PG 5421 — 520 (2021/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*